# බෙහෙත් ඔරුව හා එහි උපයෝගීතාව පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

## (වාරියපොළ ප්‍රදේශයේ පෞද්ගලික ආයුර්වේද මධ්‍යස්ථානයක භාවිත වන ශිලා බෙහෙත් ඔරුවක් ඇසුරෙන්)

චන්දිමා සඳමාලි මධුෂිකා, නිමේෂා නිල්මිණී තෙන්නකෝන්, නුවන්දි තාරුකා හේරත්, රුවන්තිකා පියුමාලි සෙනවිරත්න

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

**ප්‍රමුඛ පද:** බෙහෙත් ඔරුව, පංච කර්ම, කසාය, දේශීය වෙදකම, වාශ්ප ඇල්ලීම.

## හැඳින්වීම

දේශීය චිකිත්සාවෙන් ආරම්භ වූ ශ්‍රී ලාංකීය දේශීය වෙදකම ඉන්දියාවෙන් මෙරටට සංක්‍රමණය වූ ආයුර්වේදයත් සමඟ සම්පූර්ණ වී වර්තමානය වන විට උතුරු ඉන්දීය ආයුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය, දකුණු ඉන්දීය සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය, අරාබි යුනානි වෛද්‍ය සම්ප්‍රදාය හා ශ්‍රී ලංකාවේ සිංහල වෙදකම යන සියල්ලෙහි ම සංකලනයක් ලෙස පවතින්නකි. සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව විවිධ රජවරුන් විසින් ගිහි පැවිදි පිරිස් හී නීරෝගී බව උදෙසා ආරෝග්‍ය ශාලාවක අනිවාර්යය හා වැදගත් අංගයක් ලෙස බෙහෙත් ඔරුව භාවිත කළ බව පෙන්වාදිය හැකි ය. රුක්කත්තන වැනි ශාක බඳ කොටස් හා ශිලා උපයෝගී කරගෙන මෙම බහෙත් ඔරු නිෂ්පාදනය කර ඇති අතර වර්තමානයේ ශේෂව පවතින්නේ ශිලා බෙහෙත් ඔරු ය. මේවා අනුරාධපුරය ථූපාරාමය අසළ, මිහින්තලේ, මැදිරිගිරිය හා දීඝවාපිය යන ස්ථාන ආශ්‍රිතව සොයාගෙන ඇත. මෙහි විශේෂත්වය වන්නේ සියල්ලක් ම ආරාම සංකීර්ණ ආශ්‍රිතව වාර්තා වීමයි. ඉපැරණි සිංහල වෛද්‍ය කර්මය තුළ රෝග නිවාරණය සඳහා ඖෂධ සාරයේ ගිල්ලවූ බවට සාහිත්‍ය මූලාශ්‍රයන්ගේ සඳහන් වේ. යෝගාර්ණවය, ප්‍රයෝගරත්නාකරය, චරක සංහිතාව, සුශ්‍රැත සංහිතාව, යෝග රත්නාකරය, වරයෝගසාරය, විනය පිටකයේ මහා වග්ගය ඉන් කිහිපයකි. ආයුර්වේද ක්‍රමය පදනම් වූයේ තුන්දොස් පිළිබඳ සංකල්පය මත ය. තුන්දොස් කීපීම රොගවලට හේතු විය. මේ සඳහා විවිධ අවස්ථාවන් හී දී ඖෂධීය ජලය හා තෛල ස්නානය කළ බව සඳහන් වේ (මැන්දිස්, 2004, 18). අර්ශස්, උණ ආදී රෝගයන් සුව කර ගැනීම සඳහා ඖෂධ ජලය සහිත ඔරු තුළ ගිල්වීම කරයි. එහි දී රෝගියාගේ ශරීරයට ඔසු දියර උරා ගැනීමක් සිදුවේ. මේ සඳහා ඖෂධ පැළෑටි, ගිතෙල්, විනාකිරි, අමුකහ ආදිය යොදා ගනී (අබේනායක, 2006. 87). වර්තමානනය වන විට ද බෙහෙත් ඔරුවෙහි ගිල්වා ප්‍රතිකාර කිරීමේ ක්‍රමය ජනප්‍රිය වී ඇත.

මෙම අධ්‍යයනයට පාදක කරගෙන ඇත්තේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේරපොළ ග්‍රාම නිළධාරී වසමේ පුංචි වාරියපොල ග්‍රාමයේ මහකිරින්ද සුව අසපුවේ දේශීය වෛද්‍ය එච්.එම්.එම්.බී හේරත් මහතා ප්‍රතිකර්ම සඳහා භාවිත කරනු ලබන ශිලා බෙහෙත් ඔරුව හා එහි උපයෝගීතාවය යි.

**ක්‍රමවේදය**

පර්යේෂණය සඳහා සාහිත්‍යය මූලාශ්‍ර, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා යන සියල්ලක්ම ඔස්සේ දත්ත රැස්කර ගැනීම සිදුකරන ලදි. අධ්‍යයන ක්ෂේත්‍රයේ වර්තමාන භාවිත බෙහෙත් ඔරුවේ උපයෝගිතාවය තුළින් අතීතයේ භාවිත කළ බෙහෙත් ඔරුවේ උපයෝගිතාවය කෙබඳු වී ද යන්න පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක් මෙහි දී සිදුකරනු ලබයි. ඡායාරූප හා වීඩියෝ පට භාවිතයෙන් දත්ත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

**ප්‍රතිඵල සාකච්ඡා**

අධ්‍යයන ක්ෂේත්‍රය තුළ පංචකර්ම චිකිත්සාව සිදුකිරීම හඳුනාගත හැකි ය. එහි දී පූර්ව කර්ම, පශ්චාත් කර්ම සහ ප්‍රධාන කර්මය ලෙස ප්‍රතිකර්ම කොටස් තුනක් යටතේ සිදුකෙරේ. මෙහි දී පූර්ව කර්ම හා පශ්චාත් කර්ම අනිවාර්යයයෙන් සිදුකරනු ලබයි. එතුළින් පූර්ණ ප්‍රතිඵලයක් ලබාගත හැකි ය. අධ්‍යයන ක්ෂේත්‍රයේ භාවිත බෙහෙත් ඔරුවෙන් සිදුවන ප්‍රධානම කාර්යයන් වන්නේ,

1. රෝගී පුද්ගලයින් නිරෝගී කිරීම.

2. නීරෝගීකම පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

යන කරුණුයි. රෝගී පුද්ගලයින් නිරෝගි කිරීම සඳහා පහතින් සඳහන් ඖෂධ භාවිත කරන ආකාරය අධ්‍යයනයේ දී හඳුනාගැනීමට හැකි විය. එහි දී අංශභාග රෝගය සඳහා බෙලි, මීදි, පලොල්, ඇත්දෙමට, අස්වැන්න, පොල්පලා, එළබටු, නික, පාවට්ටා, ඇහැළ, කටු කරඬු, තොට්ල්ල යන ඖෂධයන්ගේ මුල් සමව ගෙන තම්බා පෙරා ගත් කසාය භාවිත කරයි. වර්තමානයේ දී නව ප්‍රවණතාවක් ලෙස සුවඳ විලවුන්, සුදු හඳුන් හා රත් හඳුන් ස්ප්‍රීතු මෙම කසායට එක් කරනු ලබන බව අධ්‍යනයේ දී හඳුනාගැනීමට හැකි විය. තව ද ආමවාත (ආතරයිටිස්) රෝගය සඳහා බෙලි, මීදි, පලොල්, ඇත්දෙමට, අස්වැන්න, පොල්පලා, එළබටු, නික, පාවට්ටා, ඇහැළ, කටු කරඬු, තොට්ල්ල මුල් හා අත්තන අල තම්බා පෙරාගත් කසාය යොදා ගනී. රත්තවාත රෝගය සඳහා එළකිරි, එඬරු තෙල් රසකිඳවලින් සෑදූ කසාය භාවිත කරණු ලබයි. අනෙක් උපයෝගීතාව වන නීරෝගිකම පවත්වාගෙන යාම සඳහා,

- දස මූල කසාය
- දෙසඳුන් කසාය (සුදු හඳුන්, රත් හඳුන්)
- ත්‍රීපලා ක්වාතය (අරළු, බුළු, නෙල්ලි)
- දාරු හරිද්‍රා ක්වාතය (වෙනිවැල්) භාවිත කරන බව ද හඳුනාගන්නට ලැබිණ.

පුරාණයේ ආරාම ආශ්‍රිත වූ ආරෝග්‍යශාලාවල දැනට ශේෂව පවතින නටඹුන් අතර දක්නට ඇති බෙහෙත් ඔරුව මගින් ද මෙම උපයෝගීතාවයන් ම සිදු වී ඇති බවට අනුමාන කළ හැකි ය. අධ්‍යයන ක්ෂේත්‍රයේ පංච කර්ම චිකිත්සාව යටතේ පූර්ව කර්මයක් වශයෙන් කසාය වාෂ්ප ඇල්ලීම හඳුනාගන්නට ලැබිණ. ඒ අනුව පුරාණයේ ද බෙහෙත් ඔරුවේ ප්‍රතිකර්මය සඳහා ඉහත සඳහන් කළ ප්‍රතිකර්මය සිදු කරන්නට ඇති බවට අනුමාන කළ හැකි ය. පූර්ව කර්ම හා ප්‍රශ්චාත් කර්ම ප්‍රධාන කර්මය සාර්ථක වීමට බලපානු ලබන බැවින් පුරාණයේ දි මේවා සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා තිබෙන්නට ඇතැයි මේ අනුව උපකල්පනය කළ හැකි වේ. මීට අමතරව අධ්‍යයන ක්ෂේත්‍රයේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ම සම්බන්ධ වීමෙන් සිදු කරනු ලබන රූපලාවණ්‍ය ප්‍රතිකර්ම සඳහා ද බෙහෙත් ඔරුව භාවිත කරනු ලබන බව දැකගත හැකි විය. ඒ සඳහා විවිධ කසායන් විවිධ රෝගීන්ගේ අවශ්‍යතා

අනුව භාවිත කරනු ලබයි. ඒවා නම් එළකිරි, දසමූල කසාය, ත්‍රිපලාක් වාතය, කෝමාරිකා කොටා එළකිරෙන් මිරිකා ගත් කසාය, සුදු හඳුන්, රත් හඳුන්, වැල් මී, වෙනිවැල් ගැට, රත්මල්, ඉගිනි ඇට යන ඖෂධයන් ය. ඒ අනුව අතීතයේ දී ද කාන්තා පිරිමි දෙපාර්ශවයට ම මේ හා සමාන වූ රූපලාවන්‍ය කටයුතු බෙහෙත් ඔරු තුළ හෝ ඒ හා සමාන ආදේශක භාවිත කරමින් සිදු කරන්නට ඇති බවට උපකල්පනය කළ හැකි ය. වර්තමානයේ රෝහල් නටඹුන් අතර හමුවන බෙහෙත් ඔරු ආරාම ආශ්‍රිතව පවතින හෙයින් භික්ෂූන්ගේ ස්වස්ථතාව සඳහා පමණක් භාවිත වන්නට ඇති බවත් එකල සමාජයේ ප්‍රභූ පැලැන්තිය ඉහත උපයෝගීතාව අරභයා බෙහෙත් ඔරු හෝ එවැනි ආදේශකයක් භාවිත කරන්නට ඇතැයි තවත් ලෙසකින් උපකල්පනය කළ හැකි ය.

මූලාශ්‍රගත තොරතුරුත් ක්ෂේත්‍ර අධ්‍යනයෙන් ලද තොරතුරුත් සලකා බැලීමේ දී බෙහෙත් ඔරු හඳුනාගන්නා ලද්දේ පුරාණ ආරාම සංකීර්ණ ආශ්‍රිත ආරෝග්‍යශාලා නටඹුන්වලින් ය. එහි දී භික්ෂූන්ගේ ස්වස්ථතාවය සඳහා පමණක් නොව රෝගී පුද්ගලයන් නිරෝගී කිරීමත් නිරෝගීකම පවත්වාගෙන යාමත් යන උපයෝගීතාවන් ද්විත්වයටම අනුව බෙහෙත් ඔරුවේ ක්‍රියාකාරීත්වය සිදු වී ඇත. වර්තමානය වන විට භික්ෂූන් සඳහාම වෙන් වූ ආරෝග්‍යශාලා නොමැති අතර ගිහි පැවිදි දෙපාර්ශවයට ම ප්‍රතිකාර සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආරෝග්‍යශාලා ක්‍රියාත්මක වේ. එහි දී දේශීය වෛද්‍ය ක්‍රමය යටතේ ප්‍රතිකාර ලබා දීමේ දී පමණක් බෙහෙත් ඔරුව භාවිත කරයි. එයින් ශිලාමය බෙහෙත් ඔරු භාවිතය සීමිත වන අතර ඒ වෙනුවට තාක්ෂණික මට්ටමින් දියුණුවට පත් ආදේශක මෙන් ම ක්‍රම ද භාවිත කරනු ලබයි.

### ආශ්‍රිත ග්‍රන්ථ


අබේනායක, වයි. ටී. (2006) *ශ්‍රී ලංකාවේ දේශීය වෙදකම හා එහි ඉතිහාසය. කෞතුකාගාර,* 12 වන කලාපය, පිටු.83-88.

ආරියවංශ, එච්.ඒ.එස්. (2007) ***පංචකර්ම විඥානය.*** එස් ගොඩගේ හා සහෝදරයෝ. කොළඹ 10.

ඉන්දික, එම්.කේ.ඒ. (2011) *අනුරාධපුර යුගයේ සෞඛ්‍ය මධ්‍යස්ථාන පරිපාලනය හා කළමනාකරණය.* **ආයුර්වේද සමීක්ෂාව. II වෙළුම,** (හත්වන කලාපය), පිටු. 93-96.

ධම්මරතන, කේ. (2006) *ආරාමික රෝහල් සහ වෛද්‍ය සේවය.* **ආයුර්වේද සමීක්ෂාව. II වෙළුම,** (දෙවන කලාපය), පිටු. 121-131.

මැන්දිස්, ඩබ්.ඩබ්.සී. (2004) *රජරට පුරාණ ආරෝග්‍ය ශාලාවන්හි දක්නට ලැබෙන බෙහෙත් ඔරු.* ***සංස්කෘතික පුරාණය.*** 1 කලාපය, පිටු. 17-19.